•

# නාග දෂ්ටයේ දී ප්‍රතිකාර

පාරම්පරික වෛද්‍ය හැරියට් එස්. රාජපක්ෂ

නාග දෂ්ටයේ දී දෂ්ට මුඛ ලක්ෂණ ලෙස අඟල හමාර පරතෙර ඇතිව දත් දෙක තුන හතර ගැඹුරට වදී. දෂ්ට මුඛය කළු පැහැ ගැන් වේ. දෂ්ටයත් සමඟ ම හිරිය, කැක්කුම, වේදනා ඇති වේ. කළු පැහැති ලේ පිට වේ. නාග විෂයට ඇතිවන රෝග ලක්ෂණ ලෙස අත් පා රුදාව, හන්දිපත් රුදාව, දූගලීම, පෙරලීම, අත් පා පොළවේ ගැසීම, නහර කැක්කුම, මාංශයේ වේදනාව, වියලි බව, තොල කට වියලීම, වියලි ඔක්කාරය, වමනය, මද නිදිමත ගතිය ඇති වේ. පලමුව දෂ්ට මුඛයට ප්‍රතිකාර කළ යුතුය. දෂ්ට මුඛය පැඟිරි කටුවකින් මදක් සිදුරු කර ලේ පිටවීමට සැලැස් විය යුතුය. විෂ ගල් තබා විෂ ඇද්දවිය හැකි අතර එසේ නොමැති විට හැකි ඉක්මනින් වැට කදුරු දල්ලක් එම කිරෙන් ම අඹරා දෂ්ට මුඛයට තබන්න. විෂ ඇදේ.

- ඒකාවේරිය, සස්සඳ, කහ, ලූණු, දම් දෙහි ඇඹුලෙන් අඹරා දෂ්ට මුඛයේ තබන්න. විෂ ඇදේ.
- එල බටු දළු, බුලත් ගිරිඳ, රස දිය සමඟ අඹරා දෂ්ට මුඛයේ තබන්න.

නාග විෂට, සෑම සර්ප විෂකටම මේ ප්‍රතිකාර කරන විට, රෝගියාගේ හිතසුව පිණිස, බිය නැතිවීමට, තුරුණුවන් නැමද, සූනියන් දේවතාවුන් වහන්සේ වඳින ගාථාව සිහිකර මැතිරීමෙන් ඉක්මන් සුවපල ලැබේ. විෂ සමනය වීම පිණිස වෛද්‍යවරයා සාදාගත් පේයාව වැනි දෙයක් විෂ අනුව වරින් වර බීමට දෙන්න.

**පේයාව වශයෙන්,**

ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, අරත්ත අල , වෙනිවැල්ගැට, කොත්තමල්ලි තම්බා බීමට දෙන්න. මේවා වියලා කුඩුකර ලඟ තබා ගැනීමෙන් තේ හැන්ද, දෙක වරින් වර නටන උණු වතුරට දමා දියකර දිය හැක.

**සර්ප විෂට දෙන ගුලියක්,**

ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, සූදුරු, කළුදුරු, අබ, සුදුළූණු, පෙරුම්කායන් ,කුරුඳු පොතු.

මේවා සමභාගව ගෙන වියළා කුඩුකර දෙහි ඇඹුලින් අඹරා තිබ්බටු ප්‍රමාණයට ගුලිකර පිරිසිදු භාජනයකට දමා උඩින් රෙදිකඩකින් වසා තෙත සිඳෙන තුරු අව්වේ වියළා ගන්න. අවශ්‍ය වේලාවන් හී දී ගුලි දෙක තුන උණු වතුරට දියකර බීමට දෙන්න.

**මුඛයට තැබීම සඳහා**

| | |
|---|---|
| මැඩිය ඒරණ්ඩ හිරුමේ කොළත් | කසා |
| සැමමේ සමව කෙටු මලවලා | යසා |
| එතුය සැම පසු කෑ මුඛ පිට මෙ | ලෙසා |
| විෂය ඉදිමුව කැක්කුම යාය | බැසා |

| | | |
|---|---|---|
| මැඩිය | - | මැඩිය කොළ |
| ඒරණ්ඩ | - | තෙල් එරඬු කොළ |
| හිරු | - | වරා කොළ |
| කසා | - | අමු කහ |

මේවා සමභාගව ගෙන ලුණු දමා කොටා මලවා ඔතන්න.

**පපුවේ ගෑමට**

- එනසාල් ඇට, කලාදුරු අල, ඉරිවේරිය, සේපාලිකා මල්, සැවැන්දරා මුල් මේවා සමභාගව ගෙන වියළා කොටා පිනි දියෙන් අඹරා ගල්වන්න. ගුණ වැඩිකර ගැනීමට-කන්ධ පිරිතෙන් සිද්ධි කරගන්න
- පොල්පලා, නීරමුල්ලිය, කෝමාරිකා මද උණුවතුරින් අඹරා නලලට පැලැස්තරයක් දමන්න. වියළි වන විට හැකි නම් තන කිරෙන් පොගවන්න. නැතිනම් උණු වතුරින් පොගවන්න. නාග දෂ්ටයට විශේෂයි.

**හිස ගැල්වීමට**

- තෝර දළු ,දිවිකදුරු දළු ,දිය බෙරලිය, බෝ පොතු ,කපු පොතු එක පමණ ගෙන පැණි දොඩම් ඉස්මෙන් අඹරා හිස ගල්වන්න.

**කෂාය වශයෙන්**

- දුම්මැල්ල , කොහොඹ පොතු ,වෙනිවැල්ගැට, රත්හඳුන් කලන් තුන බැගින් ගෙන කෂාය කර දෙවේලට දෙන්න.
- අරත්ත අල , වෙනිවැල්ගැට, කොත්තමල්ලි තම්බා හැකි පමණ වරින් වර බීමට දෙන්න.

**කැඳ**

- ඇසටු - බෝ පොතු කොටා හීනැටි හාලෙන් කැඳ පිස දෙන්න.
- කරපිංචා කොළ පොතු කොටා හීනැටි හාල් දමා කැඳ පිස ගිතෙල් මිශ්‍ර කර දෙන්න.

**නස්න**

- උඳුපියලිය, කුර මුල්, කොටා මිරිකා පෙරා එළගිතෙල් මිශ්‍රව නස්න කරන්න.
- සස්සඳ මුල් ,ඉරමුසු මුල් දෙවර්ගය අඹරා නර මුත්‍රයෙන් අඹරා නස්න කරන්න.
- දත්කැටිය සහමුලින් ගෙන කොටා මිරිකා නර මුත්‍රයෙන් නස්න කරන්න. (මුත්‍රා ගන්න විට අවුරුදු දොලහින් පහල දරුවකුගේ මුත්‍රා ගන්න)

**නාග විෂට දෂ්ට මුඛයේ ආලේප කරන බෙහෙත්**

- බුත්සරණ දළු , ගොඩමානෙල් අල , බෝ පොතු මේවා කොටා මිරිකා උක් පැණියෙන් කකාරා ගනු.
- ඇත්තෝර, ඇත්දෙමට, ඇත්අගුන කොටා මිරිකා කිතුල් තෙලිදිය වත්කර කායම සේ උයා දෙහි ඇඹුලින් දියකර ගන්න.

**නාග විෂට අංජන**

බානට කැප ඇති ඕවිට ගන්නේ
කීමට සතරේ පද දූන් ගන්නේ
පානට යදිමින් ඇසට ලවන්නේ
මේවට නයි විෂ යහපත් වන්නේ

වැල් කැප්පෙට්ටියා ලීය පහනට අල්ලා රත්කර එයින් බේරෙන බිංදු අංජන ලන්න.

ඉල්මස පසුකර බෑයට ගන්නේ
උල්කර ලීයේ මුල් අරගන්නේ
බැටදී ගත් තෙල් එක්කර ගන්නේ
නාග විෂට මෙය නස්න කරන්නේ

උඳුපියලිය, කුර මුල් කොටා මිරිකා ගත් යුෂ එළෙඟිතෙලින් නස්න කරන්න.

මගුලේ යන්නන් දූක ලා
කුඹුරේ මඩ කලල් ක ලා
වැස්සට පැලයට ඉඳ ලා
නාග විෂට නස්න ක ලා

මගුල් කරඳ, කුඹුරු ඇට මද සිහිනියට කොටා නර මුත්‍රයෙන් අනා පෙරා නස්න කරන්න.

**නාග විෂට මැල්ලුමක්**

විජයා නෝනට අඩගහ පල්ලා
මැලිනොව හස්නය අගටම අල්ලා
දිලිහෙන කහ ලුනු එක්කර පල්ලා
පිලිවැද නයිවිෂ යයි නුඹ පල්ලා

වැල් රුක්අත්තන කොළ, අත්තන කොළ, කොළ කහ ලුණු දා මලවා ඔතන්න.

බූමියේ රස ඇති බිම හට ගන්නේ
ඇත් අඩි පමණට කොල දූන ගන්නේ
පිස්සු විකාරෙට මලක් පිපෙන්නේ
නයි විෂයට සහමුලින් කවන්නේ

රට එඬරු කොළ, පොතු කොටා මිරිකා පොවනු. එම රොඩු මලවා ඔතන්න.

ලිපට දූමූ දර නම දූන ගන්නේ
ඇඟට උඩින් ගෙන ගිල්ලා පන්නේ
විසට නියම කොළ කැඳ පිස දෙන්නේ
පොලට කියන නම කහ ලුණු ලන්නේ

පෙනෙල කොළ යුෂ ඇඟ ගැල්වීමද, කැප්පෙට්ටියා කොළ කැඳ පිස දීමද, බිම් පොල් කහ, ලුණු දමා කොටා මලවා එතීම ද යෝග්‍ය වේ.

| | |
|---|---|
| වැඩිකල නිදිමත පිසදා | ගන්නේ |
| පොඩිකල විස දූවිලි සම | ගින්නේ |
| වෙඩිකල බය සිව් පා | වැන්නේ |
| දූඩිකල නයි විස බැස යති | උන්නේ |

නිදිකුම්බා, විස දුලිය, ඇත් දෙමට යන මේ ඔසු කොටා මලවා නයි දෂ්ටයට මුඛයේ ඔතන්න.

| | |
|---|---|
| ගොයියෝ හොඳ නයි විසයට | යහපත් |
| දෙවියෝ වෙසෙනා මල් ඇති | ගසකුත් |
| මයි හා පෝවට කියනා | නමකුත් |
| අයියෝ යහපති තුඹ කොළ | ගත්තොත් |

ගොවි වැලේ කොළද , සපු කොළද, බිම් පොල් කොළද, තුඹ කොළ යන මේවා කොටා කහ ලුණු ලා මලවා ඔතන්න. දිවිකදුරු කොල නාග විෂට ඉතා හොඳයි. යකිවනස්ස කොල කොටා මිරිකා ආලේප කිරීම යහපත්.

**සර්ප විෂට දුම් වේදු**

සියළුම සර්ප විෂට දුම් අල්ලනු ලැබේ. දුම් වේදු රාත්‍රී කාලයටත් වාෂ්ප වේදු දවල් කාලයටත් යහපති.

**දුම් වේදු**

- තුත්තිරි මුල් ගෙන නර මුත්‍රා ටිකක් දමා කොටා පොල්කටු අගුරින් දුම් අල්ලන්න.
- දුම්මල වී පොතු (දහයියා) දෙහි කොළ පොතු එක පමණ ගෙන කොටා පොල්කටු අඟුරින් දුම් අල්ලන්න.
- කැකුණ මැලියම් බිංදුම්මල ඇත්තුත්තිරි කුඩුකර පොල්කටු අඟුරින් දුම් අල්ලන්න.

**වාෂ්ප වේදු**

- එලබටු ගස සහමුලින් වතුර දමා උණුකර වාශ්ප වේදුව දෂ්ට මුඛයට අල්ලන්න.
- යකිනාරං කොල පොතු තලා තම්බා  වාශ්ප වේදුව දෂ්ට මුඛයට අල්ලන්න.
- පස් පැඟිරි කොළ, කළු හබරල, කිරිංගල අල තම්බා වාශ්ප වේදුව දෂ්ඨ මුඛයට අල්ලන්න.
- රැන, ගස්ලබු කොල මුල් පොතු සහමුලින් ගෙන තම්බා වාශ්ප වේදුව දෂ්ට මුඛයට අල්ලන්න. උග්‍ර විෂ අවස්ථාවලදී මෙයට ගෝ මුත්‍රා දමා දුම් අල්ලන්න.

**පත්තු**

- සිවංගුරු, වියන් දුඹුලු, වියලි කහ කුඩු ,රත් හඳුන් කුඩුකර දෙහි ඇඹුලින් අනා ගන්න.
- කරඳ, තොටිල, බලුදං, කොට දිඹුලා කොළ පොතු කහ ලුණු ලා කොටා මිරිකා එම ඉස්ම දෂ්ට මුඛයේ ගාන්න.

**තැවිලි**

- තල, සතකුප්ප, එරඬු ඇට, මද, වී පොරි, රන්වන් පාට වනතුරු කබලේ බැද කුඩුකර එළෙඟිතෙල් හෝ එරඬු තෙල් මිශ්‍රකර පොට්ටනි බැඳ වණ්ඩුවෙන් තම්බා තවන්න.
- ත්‍රිඵල්, සුදුරු, උළුහාල් සමව ගෙන අඹරා දොඩම් හෝ දෙහි ඇඹුලෙන් දියකර කකාරා ගෙලෙන් පහල ගාන්න.
- බලුදං, මාදං කොළ පොතු , කහ, ලුණු ලා කොටා පොට්ටනි බැඳ වණ්ඩුවේ තම්බා ගෙලෙන් පහල තවන්න.
- බුපුල , කරඳ, ඇහැල කොළ, පොතු කොටා පොට්ටනි බැඳ වණ්ඩුවේ තම්බා ගෙලින් පහල තවන්න.

**හිසගැල්වීම**

- පොල් පලා - උඳු පියළිය කොටා මිරිකා හිස ගල්වන්න.
- නීර මුල්ලිය - දෑසමන් මල් කොළ කොටා මලවා මද රස්නෙන් හිස ගල්වන්න.

**සේදීම**

- සියඹලා කොළ, ගොරකා අඬු, දෙළුම් කොළ තම්බා සෝදන්න.
- ගම්සූරිය, ඉත්තෑ කොළ තම්බා සෝදන්න.

**විෂ අවසානයේ විරේකය**

ගස්කැප්පෙට්ටියා කොළ, පොතු පැසුණු පොල් සමඟ කොටා මිරිකා එම ඉස්මට එඬරුතෙල් මේස හැඳි දෙකක් දමා බීමට දෙන්න. වයස අනුව එඬරු තෙල් අඩු වැඩි කරන්න. සර්ප දෂ්ටයෙන් රෝගියා සම්පූර්ණ සුවය ලබා තිබේ දැයි දැනගත හැක්කේ ත්‍රිදොස් සම තත්ත්වයේ තිබීමයි.